# නිවේදනය යි!

**1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් (Authorized Officers) සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් (Officers Authorized to Institute Proceedings & Conduct Prosecutions) වෙත:**

**සෝරෝ ඇබමැක්ටින් (ලි.ප.අ. G090000) නිෂ්පාදනය අනුකරණය කරමින් ව්‍යාජ නිෂ්පාදනයක් බෙදා හැරීම හා අලෙවි කිරීම.**

වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 14 සහ 15 වන වගන්ති ප්‍රකාර රට තුළ භාවිතා වන සියළුම පළිබෝධනාශක නිෂ්පාදන අනුමත ලේබලයකින් සහ ප්‍රමිතියෙන් යුක්තව ලියාපදිංචි වී තිබිය යුතුය. එහෙත්, සෝරෝ ඇබමැක්ටින් (ලි.ප.අ. G090000) නිෂ්පාදනය අනුකරණය කරමින් එම නාමය යටතේ ම වංචනික ලෙස බෙදාහරින ලද සහ අලෙවි කරන ලද ව්‍යාජ නිෂ්පාදනයක් සම්බන්ධයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත මූලික තොරතුරු අනාවරණය වී ඇත.

වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි සෝරෝ ඇබමැක්ටින් (ලි.ප.අ. G090000) අඩංගු නීත්‍යානුකූල නිෂ්පාදනය හා සැසඳීමේ දී ව්‍යාජ අනුකරණවාදී නිෂ්පාදනයේ ලේබලයේ අන්තර්ගත වර්ණ සංයෝජනය සහ වෙළෙඳනාමය ද ඇතුළුව මුහුණත් පැනලයේ මුද්‍රිත අක්ෂර හැඩහුරුකම් අතර පැහැදිළි වෙනස්කම් දැක්වේ. මීට අමතරව නීත්‍යානුකූල නිෂ්පාදනයේ ලේබලයේ අන්තර්ගත ඇසුරුමේ ප්‍රමාණය මුද්‍රණය කර ඇති අතර ව්‍යාජ අනුකරණ නිෂ්පාදනයේ එම තොරතුර ඩොට් සංකේතයෙන් සඳහන් වේ. තවද, නිර්දේශ අඩංගු පසුපස පැනලයේ තොරතුරු ව්‍යාජ අනුකරණ නිෂ්පාදනයේ බොඳ වූ අක්ෂර ගැළපීම් සහිත වේ (**ඇමුණුම 1**).

ඇඹිලිපිටිය, හම්බන්තොට, හම්බෙගමුව වැනි ප්‍රදේශවලින් හමු වී ඇති මේ සමහ දැක්වෙන සෝරෝ ඇබමැක්ටින් (ලි.ප.අ. G090000) අනුකරණ නිෂ්පාදනය පිළිබඳව සියළුම පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් හා සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් අවධානයෙන් සිටින ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ. සියළුම නීති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පැවරී ඇති විධි විධාන පරිදි විධිමත් විමර්ශන පවත්වා නීත්‍යානුකූල පියවර ගන්නා මෙන් මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජේ.ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2020 ජූනි මස 24 වන දින,
පේරාදෙණිය.

Tel./Fax.) 081 2388135 or (Tel.) 081 2388076







සෝරෝ ඇබමැක්ටීන් නීත්‍යානුකූල නිෂ්පාදනය (වම් පස) සහ සෝරෝ ඇබමෙක්ටීන් ව්‍යාජ අනුකරණ නිෂ්පාදනය (දකුණු පස)